# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/04/LH/09/2021 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2021.12.30 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඇතුළු සියලු නිලධාරීන් වෙත,

## අයවැය - 2022
## ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන

උක්ත කරුණ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක NPD/GSP/2022 හා 2021.12.15 දිනැති චක්‍ර ලේඛ අංක MF/NPD 02/2021 හා අග්‍රාමාත්‍ය අතිරේක ලේකම් හා ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යයසාධන බලකායේ සමලේකම්ගේ අංක PTF/01/IBP-2022/RDP හා 2021.12.19 දිනැති ලිපිය හා බැඳේ.

02. 2022 වර්ෂයේ අයවැය තුලින් ප්‍රතිපාදන වෙන් කිරීමේදී ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කිරීම තුළින් සංවර්ධනයේ ප්‍රතිලාභ කඩිනමින් මහජනතාව වෙත ලබාදීමට රජය කටයුතු කරමින් සිටී.

03. 2022 වර්ෂයේ අයවැය මඟින් ක්‍රියාත්මක කරනු ලබන **"ගම සමඟ පිළිසඳරක්"** ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධන ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මඟින් සිදු කිරීමට දැනටමත් උපදෙස් ලබාදී ඇති අතර ප්‍රාදේශීය ලේකම්ගේ හා දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය යටතේ සමස්ත වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වන උපදෙස් හා මඟපෙන්වීම් උක්ත චක්‍ර ලේඛය හා ලිපිය මඟින් දැනටමත් ලබාදී ඇත.

04. විවිධ ධාරාවන් ඔස්සේ ග්‍රාමීය සංවර්ධනය සඳහා ප්‍රතිපාදන වෙන් කරන ආකාරය එහි සඳහන් කර ඇති අතර, ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සඳහා අවම වශයෙන් මින් 40% ක් වෙන් කළ යුතු වේ. එහෙත් ජාතික හා ප්‍රාදේශීය අවශ්‍යතාවය හා නිෂ්පාදන ඵලදායිතාවය මත මෙහි උපරිම සීමාව නොසලකා හැරිය හැකිය.

05. ජීවනෝපාය සංවර්ධන යෝජනා හඳුනාගැනීම යටතේ උක්ත චක්‍ර ලේඛයේ සඳහන් පරිදි තෝරා ගනු ලබන ප්‍රතිලාභීන් හා ව්‍යාපෘති සඳහා අදාල තාක්ෂණික නිලධාරීන් සම්බන්ධීකරණය හා තොරතුරු පද්ධතිය පවත්වාගෙන යාම ග්‍රාම නිලධාරී වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ වගකීමක් වේ. මෙහිදී තෝරාගන්නා පිරිස පිළිබඳව උක්ත චක්‍ර ලේඛ මඟින් උපදෙස් ලබාදී දී ඇති අතර මෙම තෝරා ගන්නා පිරිස සමෘද්ධිලාභීන් පමණක් නොවන බව අවධාරණය කරමි.

06. මෙහිදී ග්‍රාමීය සංවර්ධනය තුල ගොඩනැගිය හැකි පවුල් පිළිබඳව ලබාගන්නා තොරතුරු දත්ත පද්ධතිය තුල විධිමත් අයුරින් යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කිරීම මෙන්ම මෙම වැඩසටහන පිළිබඳව නිලධාරීන් හා ප්‍රජාව මනාව දැනුවත් කිරීම තුලින් ඔවුන්ගේ ආකල්ප සංවර්ධනය කිරීම ද වැදගත් වේ.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

07. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී ප්‍රතික්ෂේප වන ව්‍යාපෘතිලාභීන්ගේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතාවය පිළිබඳව විමසා බලා ඒ පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් සමෘද්ධි ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් නිලධාරීන් වෙත ලබාදිය යුතු වේ.

08. සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් අදාල විෂයභාර නිලධාරීන්ගේ මඟපෙන්වීම මත ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා හඳුනාගනු ලබන ව්‍යාපෘතිලාභීන් ග්‍රාමීය කමිටුවේ නිර්දේශය සහිතව කලාප කළමණාකරු / ව්‍යාපෘති කළමණාකරු / මුලස්ථාන කළමණාකරු මඟින් ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ නිර්දේශය ලබාගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු වේ. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලද ව්‍යාපෘතිලාභීන් පිළිබඳ තොරතුරු CRM මොඩියුලයට ඇතුලත් කිරීම ව්‍යාපෘති කළමණාකරු හා මුලස්ථාන කළමණාකරුගේ වගකීමක් වේ. මෙම සියලු කටයුතු දිස්ත්‍රික් මට්ටමින් අධීක්ෂණය කිරීම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්ගේ වගකීමක් වේ.

09. ග්‍රාමීය ජනජීවිතයේ බිඳවැටුණු ජීවනෝපාය නැවත නගා සිටුවීමට හා ග්‍රාමීය නිෂ්පාදන ආර්ථිකයට ජවයක් ලබාදීමට ඉවහල් වන ජීවනෝපාය ව්‍යාපෘති තෝරා ගැනීම සැම විටම සිදු කළ යුතු වේ. විශේෂයෙන්ම අපනයන අභිමුඛ හා ආනයන ආදේශන නිෂ්පාදන කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් ලබාදිය යුතු අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී කාන්තාවන් හා තරුණ ප්‍රජාව ඉලක්ක කරගත් ව්‍යාපෘති කෙරෙහි විශේෂ සැලකිල්ලක් යොමු කිරීම වැදගත් වේ. මෙම ව්‍යාපෘති සඳහා ව්‍යාපෘතිලාභීන් හඳුනාගැනීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ප්‍රගතිය හා තොරතුරු වාර්තා කිරීම ආදී සියළුම කටයුතු වලදී ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරන සියළුම නිලධාරීන් සමඟ මනා සම්බන්ධීකරණයෙන් ඔවුන්ට අවශ්‍ය සහාය ලබාදෙමින් කටයුතු කිරීමට සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හා සමෘද්ධි කළමණාකරුවන් සැම විටම වග බලා ගත යුතු වේ.

10.ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශය ලබාගෙන දිස්ත්‍රික් ලේකම් වෙත අනුමැතියට ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා සඳහා අවශ්‍ය අනුමැතිය ලැබුණු පසු අදාල රේඛීය ආයතන නිලධාරීන් සමඟ මනා සම්බන්ධීකරණයෙන් ව්‍යාපෘතිලාභීන් සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීමට පුහුණු වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම ව්‍යාපෘති කළමණාකරු සහ මුලස්ථාන කළමණාකරු විසින් සිදු කළ යුතු වේ.

11. 2022 වර්ෂයේ සියළුම වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ කාර්තුමය පදනමින් බැවින්, ඒ අනුව ව්‍යාපෘති සැලසුම් කර අනුමැතිය ලබාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලරාමුව හා ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීමට අදාල කාලය නිවැරදිව තීරණය කර ප්‍රතිපාදන අවශ්‍යතාවය ඉල්ලුම් කිරීම වැදගත් වේ.

12. මේ පිළිබඳ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ සැලැස්ම සකස් කර ගැනීමට ඒ ඒ විෂය ක්ෂේත්‍රයට අදාල ආයතන වල නිලධාරීන්ගේ සහාය ලබා ගැනීමට හා එය සම්බන්ධීකරණය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

13. ඒ අනුව මෙම සියලු දෙනාගේ සහභාගීත්වය ඇතිව මෙම කටයුතු ග්‍රාමීය මට්ටමින් ප්‍රජා සංවිධාන හා අප නිලධාරීන් විසින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතු වේ.

14. මේ පිළිබඳව අවස්ථානුකූලව ලබාදෙන උපදෙස් හා මඟ පෙන්වීම් අනුව ඉදිරි කටයුතු සැලසුම් කරගන්නා ලෙසද තවදුරටත් දන්වමි.

මෙම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ඔබ ඇතුළු කාර්යය මණ්ඩලයෙන් ලැබෙන සහාය ඉතා අගය කොට සලකමි.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 1. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
2. අග්‍රාමාත්‍ය අතිරේක ලේකම් හා සම ලේකම්, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යයසාධන බලකාය - කා.දැ.ගැ.පි.
3. ලේකම්, සමෘද්ධි,ගෘහ ආර්ථික,ක්ෂුද්‍ර මූල්‍ය,ස්වයං රැකියා,ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
4. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
5. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
6. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.

11.2022 ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දැනටමත් ඔබ වෙත ලබාදී ඇති චක්‍ර ලේඛ හා උපදෙස් සමඟ අනුගත වෙමින් 2022 ජනවාරි මස 10 දින වන විට මෙම ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සියළුම නිලධාරීන් සමඟ එක්ව සමාරම්භක කටයුතු සිදු කරන මෙන් දන්වමි.